www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලාංකික දෙමල දේශපාලන සිරකරුවන් තමන් නිදහස් කරන ලෙස බල කරමින් උපවාසයක් අරඹයි

**Sri Lankan Tamil political prisoners stage hunger strike to demand their release**

**සමන් ගුනදාස විසිනි.**
2010 ජනවාරි 23

සිය ගනනක් දෙමල සිරකරුවන් ජනවාරි 14 වන දා සිය උපවාසය ආරම්භ කොට අටවන දිනයේදී එය අත්හිටවනු ලැබුවේ ඔවුන්ගේ ඉල්ලීම් සලකා බැලීමට ආන්ඩුව 'පොරොන්දු' වූ පසුවය.

උපවාසකරුවන් බල කර සිටින්නේ ආන්ඩුව විසින් ඔවුන් නිදහස් කල යුතු බවය. එසේ කල නොහැකි නම් තමන්ට එරෙහි චෝදනාවන්ට පිලිතුරු සැපයීමට සාධාරන හා කඩිනම් අයුරින් නඩු දැමිය යුතු බවයි. කොලඹ අනුරාධපුරය යාපනය මඩකලපුව හා ත්‍රිකුනාමලයේ රඳවා සිටින සිරකරුවන් 774ක් උපවාසයට සම්බන්ධ විය.

සිරකරුවන්ගේ ඉල්ලීම් මාස දෙකක් තුල ඉටු කරන බවට ජනාධිපති මහින්ද රාජපක්ෂ පොරොන්දු විය. ජනවාරි 26 ජනාධිපතිවරනයේ ආන්ඩු පක්ෂයේ අපේක්ෂකයා ලෙස තරග වදින රාජපක්ෂ මෙම විරෝධතාවය අවසන් කිරීමට උත්සුක වූයේ එමගින් දශක තුනකට ආසන්න කුරිරු යුද්ධයේ හා නොනවතින වාර්ගික පීඩනයේ ගොදුරු බවට පත්ව ඇති දෙමල මහ ජනතාවගේ වෛරයට හා ද්වේෂයට ලක් වෙතැයි බියෙනි.

රැඳවුම්කරුවන් නිදහස් කිරීම හෝ අවම වශයෙන් ඔවුන් ත්‍රස්තවාදීන් යැයි පවසන ආන්ඩුවේ චෝදනා ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට ඉඩ සලසා දීම රාජපක්ෂගේ පොරොන්දු වලට අයත් නොවේ.

රිමාන්ඩ් බන්ධනාගාර වල රඳවා සිටින්නන්ට අමතරව ශ්‍රී ලංකා ආන්ඩුව විසින් තවත් දස දහස් ගනනක් දෙමල සිරකරුවන් රටෙහි නොයෙකුත් තැන් වල ඇති සිර කඳවුරු වල රඳවා ඇත. 2006 ජූලි මස රාජපක්ෂ ආන්ඩුව රට යලි පූර්න යුද්ධයකට ඇද දැමීමෙන් අනතුරුව මෙම අත්අඩංගුවට ගැනීම් උත්සන්න විය.

සිරකරුවන් රඳවා ගෙන සිටින්නේ මර්දනකාරී 'ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත' යටතේය.

ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් හට යමෙකු ත්‍රස්ත ක්‍රියා පිලිබඳ සැක කොට චෝදනා ඉදිරිපත් නොකර මාස 18ක් රඳවා තැබිය හැකිය. ඉන් අනතුරුව රැඳවුම්කරුවන් අධිකරනයක් ඉදිරියට පැමිනවිය යුතු නමුත් අධිකරනය සමග සහයෝගීව නඩුවට පෙර කාල පරිච්ඡේදය සීමාවකින් තොරව ඇදගෙන යාමට පොලීසියට හැකියාව ඇත. එහි අර්තය නම් ඔප්පු නොකෙරුනු චෝදනා මත නීතිමය සහනයකින් තොරව පුද්ගලයින් වසර ගනනාවක් වුවද රඳවා ගත හැකි බවයි. සැකකරුවන්ගෙන් 'පාපොච්චාරන' ලබා ගෙන චෝදනා ඔප්පු කිරීමට ඒවා යොදා ගැනීමට ද ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ ඉඩ සැලසේ. මෙමගින් සිදු වන්නේ වධ දීම් පිලිබඳව නම් දරා සිටින ශ්‍රී ලාංකික ආරක්ෂක හමුදාවන් සාවද්‍ය පාපොච්චාරන ලබා ගැනීමට හා බොරු චෝදනා ඇටවීමට පෙලඹවීම ය.

වාර්ගික පීඩනය හා ප්‍රචන්ඩත්වය මගින් බොහෝ දෙමල තරුන ජනයා ආන්ඩුවට එරෙහිව ආයුධ ගන්නා තැනට පත් කිරීමට ශ්‍රී ලාංකික සිංහල සුපිරි පාලක පන්තිය ක්‍රියා කලේය. සුපිරි පාලක පන්තියේ ප්‍රතිචාරය වූයේ ලේ වැකි කැරලි මර්දන යුද්ධය හා දෙමල ජනයාගේ අයිතීන් තව තවත් ක්‍රමානුකූල ලෙස උල්ලංඝනය කිරීම ය. සියලු එල්ලයන් හා වුවමනාවන් වෙනුවෙන් අත් අඩංගුවට ගැනීම් මෙන්ම බහුජන අත් අඩංගුවට ගැනීම් හා නඩු නොමැතිව රඳවා ගැනීම් ද ඊට අයත්ය.

දෙමල රැඳවියන් දේශපාලන සිරකරුවන් ලෙස නම් කිරීම ප්‍රතික්ෂේප කල ආන්ඩුව අත් අඩංගුවට ගන්නා ඕනෑම අයෙකු දෙමල විමුක්ති කොටි සංවිධානයට සම්බන්ධ 'ත්‍රස්තවාදීන්' ලෙසට ලේබල් කිරීමට ක්‍රියා කලේය. නමුත් රැඳවියන්ට එරෙහිව නඩු දැමීමට ආන්ඩුව අසමත් වීම මගින් පන්නුම් කරන්නේ ඔවුනට එරෙහිව පිලිගත හැකි සාක්ෂි ඉදිරිපත් කිරීමට පොලිසියට පවතින නොහැකියාවයි.

උපවාස කල සිරකරුවන් සඳහන් කලේ ඔවුන් පෙරදී කල ඉල්ලීම් එක්කෝ නොතකා හැරි බවත් නැතහොත් වාචිකව පොරොන්දු වී ඒ පිලිබඳව කිසිවක්

නොකල බවත්ය. තම ඉල්ලීම් වෙනුවෙන් පසුගිය වසරේදී සිරකරුවන් උපවාසයන් සතරක් පැවැත්වීය.

සිරකරුවන් 35 දෙනෙකු මෑත උපවාසය ආරම්භ කිරීමට පෙර මාධ්‍යයන්ට නිකුත් කල ලිපියක මෙසේ සඳහන් වේ. 'කිසිම පරීක්ෂනයකින් හෝ නීතිමය ක්‍රියා මාර්ගයකින් තොරව රිමාන්ඩ් බන්ධනාගාරයේ රඳවා සිටින දේශපාලන සිරකරුවන් වන අපි ජනවාරි 6 දින උදේ 6.00 සිට උපවාසයක් අරඹන්නෙමු. පොලීසිය විසින් බොරු චෝදනා මත ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත හා හදිසි නීති රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගත් අපව වහාම නිදහස් කරන ලෙස හෝ ඇප දෙන ලෙස හෝ පොදු සමාවක් දෙන ලෙස අපි බල කර සිටිමු.

'යථා සන්නද්ධ කන්ඩායම් වල ප්‍රධාන සාමාජිකයින් හට ආන්ඩුවේ ඉහලම තනතුරු ලබාදී ඇති තතු තුල කිසිම ප්‍රචන්ඩත්වයකට සම්බන්ධ නොවූ අප හට බොරු චෝදනා මත දඬුවම් කරන්නේ ඇයි? අපට අපගේ පවුල් අහිමි වී ඇත. අපගේ අධ්‍යාපනය අප වෙතින් කොල්ලකාගෙන ඇත. දැන් අපව කිසිවෙකුත් නැතිව හුදෙකලා කර ඇත.'

ඔවුන් පෙන්වා දෙන දෙමල නායකයින් දෙදෙනා වන්නේ නැගෙනහිර පලාතේ එල්ටීටීඊ යේ හිටපු නායකයින් වන වී. මුරලිදරන් (කරුනා අම්මාන්) හා සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් හෝ පිල්ලෙයාන් ය. දෙදෙනාම එල්ටීටීඊයෙන් ඉවත්ව ශ්‍රී ලංකා මිලිටරියට හා එල්ටීටීඊය සමූලඝාතනය කිරීමේ එහි යුද්ධයට සහය දුන්නේය. ඊට හිලව් ලෙස කරුනා හට කැබිනට් ඇමති ධූරයක් ලබා දුන් අතර පිල්ලයාන් හට නැගෙනහිර පලාතේ මහ ඇමති වීමට ඉඩ සලසා දිනි.

2008 අප්‍රේල් මස දී කොලඹට තදාසන්න කොටහේන හි දී සුදු වෑන් රථයකින් පැමිනි නොහඳුනන අවි ගත් පිරිසක් හෝ ආරක්ෂක හමුදා මගින් පැහැර ගනු ලැබූ රාජ්‍ය චිත්‍රපට සංස්ථාවේ හිටපු අධ්‍යක්ෂවරයෙකු වන 52 හැවිරිදි කේ දේවදාසන් එක් සිරකරුවෙකි.

කොලඹ නව මැගසින් බන්ධනාගාරය රඳවා සිටින ඔහු අනෙක් අයට දින කිහිපයකට පෙර එනම් ජනවාරි 1 දින සිය උපවාසය ආරම්භ කරමින් බල කර සිටියේ තමන්ව නිදහස් කරන ලෙස හෝ ඉක්මනින් නඩු දමන ලෙස ය.

පසුගිය වසර හතර තුල විශේෂයෙන්ම කොලඹ නගරයේ දෙමල ජනයා අත් අඩංගුවට ගැනීම් ඉහල ගියේය.

මිලිටරිය හෝ අනෙකුත් රාජ්‍ය ඒජන්තයින් හෝ ආන්ඩුවට සම්බන්ධ කොටස් දෙමල ජනයා පැහැර ගැනීමටත් ප්‍රචන්ඩත්වයට ලක් කොට අනතුරුව පොලිසියට රඳවා ගැනීමට බාරදීමත් ක්‍රියාත්මක විය. මෙම ත්‍රස්ත ව්‍යාපාරය ආන්ඩුවේ කටයුතු විවේචනය කල මාධ්‍යකරුවන්ට ද දිගේලි කෙරිනි. එල්ටීටීඊට සහය දුන්නේය යන අභූත චෝදනාව එල්ල කරමින් සමහර සිංහල වෘත්තීය සමිති නායකයන්ද පැහැර ගැනුනි.

දෙමල රැඳවියන් පිලිබඳව සොයා බලන බවට රාජපක්ෂ පොරොන්දු වීමට කෙටි වේලාවකට පෙරාතුව නීති කටයුතු පිලිබඳ ඇමති මිලින්ද මොරගොඩ කියා සිටියේ විසඳුමක් වහාම ලබා දෙන බවය. එහෙත් ආන්ඩුව දිගටම කියා සිටින්නේ ඔවුන් දේශපාලන සිරකරුවන් නොව ත්‍රස්තවාදීන් බවය.

දෙමල වතු කම්කරුවන් විශාල ප්‍රමානයක් නියෝජනය කරන ලංකා කම්කරු කොන්ග්‍රසයේ (සීඩබ්ලිව්සී) නායකයා හා කැබිනට් ඇමතිවරයකු වන ආරුමුගම් තොන්ඩමන් ජනවාරි 20 ප්‍රවෘත්ති සාකච්ඡාවක් නුවරඑලියේදී කැඳවා කියා සිටියේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (ත්‍රවැප) යටතේ රඳවා සිටි වතු තරුනයින් 24 දෙනෙකු දැනටම නිදහස් කර ඇති අතර එම දිනයේදී තවත් 50ක් නිදහස් කරන බවත් තවත් සිරකරුවන් 28ක් ඊනියා පුනරුත්ථාපන කඳවුරු වලට යවන බවත්ය. (මෙම සිරකරුවන් කිසිවකු හෝ උපවාසයට සම්බන්ධ ද යන්න තවම පැහැදිලි නැත.) යුද්ධය අවසානය සමග සීඩබ්ලිව්සී යේ පාවා දීමේ කොන්ත්‍රාත්තුවට එරෙහිව වැඩෙන විරුද්ධත්වය තුල රැඳවියන් සම්බන්ධයෙන් මැදිහත් වීමට තොන්ඩමන් හට අලුතින් පීඩනය යෙදිනි.

යුද කාලය තුල බොහෝ වතු තරුනයින් අත් අඩංගුවට ගැනිනි. එල්ටීටීඊ හිතවාදීන් යැයි පැවසෙන ලැයිස්තු සම්පාදනය කර දීමෙන් අත් අඩංගුවට ගැනීම් සඳහා පොලිසියට උදව් කල බවට කම්කරුවෝ සීඩබ්ලිව්සී නායකත්වයට චෝදනා කලහ. යථා වශයෙන් මෙම තරුනයින්ට එල්ටීටීඊය සමඟ කිසිම සම්බන්ධතාවක් නොපැවතිනි. ඔවුන් අත්අඩංගුවට ගැනුනේ වෘත්තීය සමිතිවල පාවා දීමට එරෙහිව වතු කම්කරුවන් හා ඔවුන්ගේ පවුල් කල සටන් යටපත් කිරීමේ උත්සාහයක් ලෙසටය.

දහස් ගනනක් දෙමල රැඳවියන් බොහෝ විට ඔවුන්ගේ සමීපතමයන්ගේ ද අනුදැනුමෙන් තොරව රඳවා සිටින දකුනු ශ්‍රී ලංකාවේ තිබෙන සිර කඳවුරකි බූස්ස. මානව හිමිකම් කොමිසමේ කොලඹ කාර්යාලය විසින් සූදානම් කරනු ලැබ එහි යාපනය කාර්යාලයට යවා ඇති වාර්තාවකට අනුව සුදු වෑන් මගින් පැහැර ගනු ලැබූ හෝ සන්නද්ධ හමුදා විසින් අත් අඩංගුවට ගත් කාන්තාවන් 50 ක් ඇතුලු තරුනයින් 800ක් බූස්සේ රඳවා ඇත. දින කිහිපයකට ඉහතදී සුදු වෑන් කල්ලියක් විසින් පැහැර ගනු ලැබූ රසියා ද්වාර්කා නමැති විශ්ව විද්‍යාල ශිෂ්‍යාව ඇයගේ දෙමව්පියන් විසින් බූස්සේදී සොයා ගනු ලැබිනි.

මෙම රඳවා ගැනීම් වලට අමතරව ආන්ඩුව විසින් යුද්ධය අවසානයේ විශේෂයෙන්ම වවුනියාවේ ඇති කල දෙමල සිවිල් වැසියන්ගේ සිර කඳවුරු තුලින් දිගු කාලීන සිරගත කිරීම් වලට දහස් ගනනක් දෙමල තරුන තරුනියන් තෝරා ගැනිනි. ඇම්නෙස්ටි

ඉන්ටනැෂනල් සංවිධානයට අනුව ආන්ඩුවේ දෘෂ්ටිකෝනයෙන් එල්ටීටීඊ කේඩරයන් වන 12,000ක් පමන මෙලෙස දිගුකාලීන අත් අඩංගුවට ගෙන තිබේ. එසේ වෙතත් රතුකුරුස සංවිධානය චෝදනා කරන්නේ එයට සබඳතා ඇති කර ගත හැක්කේ මෙම තරුනයින් 2,000 ක් සමග පමනක් යන්නය. දෙමල ජනයාට සලකන ආකාරය පිලිබඳව පැන නැග ඇති කෝපය අස්වසාලීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස පසුගිය සති කිහිපය තුල තරුන තරුනියන් දුසිම් කිහිපයක් මුදා හැරිනි.

ඇම්නෙස්ටි ඉන්ටනැෂනල් සංවිධානය මානව හිමිකම් පිලිබඳ කරුනු දහයකින් යුත් න්‍යාය පත්‍රයක් ඉදිරිපත් කොට ප්‍රධාන ජනාධිපති අපේක්ෂකයින් වන රාජපක්ෂ හා හිටපු හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා හට එය පිලිගන්නා ලෙස කියා සිටියි. හිතු මනාපයේ අත් අඩංගුවට ගැනීම් හා 'හදිසි නීතිය යටතේ රඳවා තබා ගැනීම්' අවසන් කිරීම ද ඊට ඇතුලත්වේ.

මෙවන් ඉල්ලීම් වලින් ලැබෙන දෙයක් නොමැත. යුද්ධ අවසානයෙන් පසු එලඹී සෑම මසකම අගමැති රත්නසිරි වික්‍රමනායක 'ත්‍රස්තවාදී තර්ජනය' දිගටම පවතින බව සඳහන් කරමින් හදිසි නීතිය දීර්ඝ කරන ලෙස පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටියේය. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ද ඉවත් නොකරන බව ආන්ඩුව අවධාරනය කරයි. ආන්ඩුව ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් බලාත්මක කර තබා ගැනීම පිලිබඳව එතරම් දෘඪ බවක් පෙන්වා සිටින්නේ සිවිල් යුද්ධයට හා ලෝක ආර්ථික අර්බුදයට, තියුනු සමාජ වියදම් කැපීමක් මගින් කම්කරු පන්තිය හා පීඩිතයින් හට ගෙවීමට සැලැස්වීම පිලිබඳ දැවැන්ත සමාජ විරුද්ධත්වයක් එය අපේක්ෂා කරන බැවිනි.

සිය මැතිවරන ප්‍රකාශනයෙන් ජෙනරල් ෆොන්සේකා කියා සිටින්නේ හදිසි නීතිය 'සංශෝධනය' කොට පවත්වා ගෙන යන බවයි. රැඳවියන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔහු අවධාරනය කරන්නේ 'ත්‍රස්තවාදයට සම්බන්ධ සියලුම රැඳවියන් නීතිය ඉදිරියට පැමිනවීම පුනරුත්ථාපනය කිරීම හෝ නිදහස් කිරීම සිදු කරන බවයි.'

සිංහල වර්ගෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන හා දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය ෆොන්සේකාගේ ආස්ථානයට පූර්න සහය දෙති. ජනවාරි 10 මාධ්‍ය සාකච්ඡාවේදී ජවිපෙ මන්ත්‍රී අනුර කුමාර දිසානායක මෙසේ පැවසීය. 'ආන්ඩුව ඔවුන්ව (දෙමල දේශපාලන සිරකරුවන්) උසාවියට ඉදිරිපත් කල යුතුය නැතහොත් පුනරුත්ථාපනය කොට නිදහස් කල යුතුය.

යුද්ධය පවතිද්දී හා යුද්ධයට පසුව තරුන දෙමල ජනයා සීමාවක් නැතිව අත් අඩංගුවට ගැනීමට ජවිපෙ සහය දුන්නේය. දැන් ජෙනරාල් ෆොන්සේකාට සහය දෙන තතු තුල හා ඔහුව ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස පින්තාරු කර ඇති තතු තුල ජවිපෙ සිය ආස්ථානය යන්තමින් සංශෝධනය කර ඇත. නමුත් ත්‍රස්තවාදියෙකු යැයි නම් කරන ඕනෑම අයෙකු හිතු මතේ අත් අඩංගුවට ගැනීමට හා නඩු වලින් තොරව දීර්ඝ ලෙස රඳවා ගැනීමට රජයට ඇති අයිතියට එය දිගටම සහය පල කරයි.

අර්බුද ග්‍රස්ත ශ්‍රී ලාංකික පාලක පන්තිය හෝ එහි යම් කොටසක ප්‍රජාතන්ත්‍ර සටන් පාඨ පිලිබඳව කම්කරුවන් තරුනයින් හෝ දිවයිනේ දෙමල ජනයා මිත්‍යාවන් ඇති නොකර ගත යුතුය. වාර්ගික යුද්ධයට සහය දුන් හා දැවැන්ත මිලිටරියක් තබා ගැනීමට සහය දුන් සියලු දෙනා දැන් යෝජනා කරන්නේ රාජ්‍ය මර්දන උපකරනයන්ට සුලු වෙනස් කම් සිදු කරන ලෙසය.

සසප හා එහි ජනාධිපති අපේක්ෂක විජේ ඩයස් සියලු දේශපාලන සිරකරුවන් ක්ෂනිකවත් කොන්දේසි විරහිතවත් නිදහස් කරන ලෙස බල කර සිටියි. එහි ජනාධිපතිවරන උද්ඝෝෂනය තුලින් සසපය පැහැදිලි කරන්නේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත හා හදිසි නීති රෙගුලාසි ද ඉවත් කර ප්‍රජාතාන්ත්‍රික අයිතීන්ට සටන් වැදීම බැඳී ඇත්තේ වත්මන් අත්තනෝමතික හා වාර්ගික පීඩාකාරී ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කිරීම හා දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා කරන අරගලයේ කොටසක් ලෙසට කම්කරු ගොවි ආන්ඩුවක් සඳහා සටන් වැදීම සමග බවය.

© www.wsws.org